# ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
# ලංකා ධීවර සංස්ථාව
# පුරප්පාඩු

**ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සේවා ගණය : ප්‍රාථමික - ශිල්පීය**

**තනතුර : රියදුරු (PL 3) - 05**

**සුදුසුකම්**
**බාහිර අපේක්ෂකයින්**

01. **අධ්‍යාපනික :** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂය හයකින් (06) සමත් වීම.

සහ

02. **වෘත්තීය:**මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම'

සහ

03. **පලපුරුද්ද:** රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක බර වාහන පැදවීමේ පලපුරුද්ද ලබා තිබීම, සහ ප්‍රායෝගික පරීක්ෂණයේ දී, ප්‍රවීණතාව තහවුරු කල යුතුවේ.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

01. **වෘත්තීය :**මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම

සහ

02. **පලපුරුද්ද:** රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) බර වාහන පැදවීමේ පලපුරුද්ද ලබා තිබීම සහ ප්‍රායෝගික පරීක්ෂණයේ දී ,ප්‍රවීණතාව තහවුරු කළ යුතු වේ.

සහ

03. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයෙහි (**PL** 1 ) හෝ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයෙහි (**PL** 2 ) හෝ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප : **PL 3- 2025 Rs. [43280 – 10x490– 10 x540-10 x 590- 12 x 630-67040]**
**රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා (ජීවන වියදම් දීමනාව) හිමි වේ.**

**වෙනත් ප්‍රතිලාභ :**

1. සේවක අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩුකර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මගින් 15% දායක මුදලක් බැර කරනු ලැබේ.
2. සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3%ක ප්‍රදානයන් බැර කරනු ලැබේ.

**පොදු කොන්දේසි**

(අ) අපේක්ෂකයින්ගේ වයස අවුරුදු දහඅටට (18) ට නොඅඩු හා අවුරුදු හතළිස් පහට ( 45) ට නොවැඩි අයවිය යුතු වේ. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.
(ආ)රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.
(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ඈ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර සමඟ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව **2026.10.12** දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (E mail : chairman@cfc.gov.lk )

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො 15, රොක් හවුස් පටුමග
කොළඹ 15.
දුරකථන අංක 0112-540455

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED